# නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයෙහි සේවක සුබසාධනය තුළින් සේවක කාර්යසාධනය කෙරෙහි වන බලපෑම අධ්‍යයනය

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***ජී.වී.ටී.ටී. ධර්මරත්න*** [1]
***ප්‍රේමා පොඩිමැණිකේ*** [2]

සංක්ෂේපය

ආයතනයක සේවාදායකයන්ට වඩා හොඳ ජීවන තත්වයක් ලබා දීමට ඉවහල් වන්නා වූ පහසුකම් හා ප්‍රස්ථාවන් ලබා දීම සේවක සුබසාධනය ලෙස නිර්වචනය කළ හැකි අතර එය සේවා මණ්ඩල කළමනාකරණයෙහි එන වැදගත් කාර්යයකි. මෙම සුබසාධන සේවා සැපයීම තුළින් ආයතනයක් ප්‍රධාන වශයෙන් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන්නේ සේවක චිත්ත ධෛර්යය වැඩි කිරීම, සේවක ඵලදායීත්වය හා කාර්යක්ෂමතාව වර්ධනය කිරීම, සේවාදායක ආකර්ෂණය වර්ධනය වැනි කාර්යයන් ය. ඒ අනුව මෙම අධ්‍යයනය සිදුකර තිබෙන්නේ නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයෙහි සේවා නියුක්තිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන එම සුබසාධන වැඩසටහන් ඔවුන්ගේ කාර්යසාධනයට කවර ආකාරයේ බලපෑමක් සිදුකර තිබේ ද යන්නයි. ඒ සඳහා කෑගල්ල දිස්ත්‍රික්කය තුළින් තෝරා ගන්නා ලද රබර් කර්මාන්තශාලා ද්විත්වයකින් අහඹු ලෙස තෝරාගත් සේවාදායකයන් 100 දෙනෙකු සම්බන්ධ කර ගනිමින් අධ්‍යයනය සිදුකර තිබේ.

මෙම අධ්‍යයනය සඳහා දත්ත හා තොරතුරු රැස් කිරීමේ දි ප්‍රාථමික හා ද්විතියික දත්ත යොදා ගත් අතර ප්‍රාථමික දත්ත රැස් කිරීම ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා මඟින් ද, ද්විතියික දත්ත රැස් කිරීම මහ බැංකු වාර්ෂික වාර්තා, සඟරා , අන්තර්ජාලය ආදිය භාවිතා කරමින් සිදු කරන ලදි. අධ්‍යයනයේ දත්ත හා තොරතුරු විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත දෙවර්ගය ම භාවිතා කරනු ලැබේ. ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යාන විධික්‍රමය තුළින් ප්‍රස්තාර, වගු, ප්‍රතිශත භාවිත කරමින් විශ්ලේෂණය කරන ලදී. ගුණාත්මක දත්ත විශ්ලේෂණය කරනු ලැබුවේ විස්තරාත්මක ක්‍රමවේදය අනුවය.

අධ්‍යයන ප්‍රතිඵලවලට අනුව කර්මාන්තශාලාවන් ද්විත්වයෙහි ක්‍රියාවට නංවනු ලබන සුබසාධන වැඩසටහන්හි වෙනස්කම් මෙන් ම එම වැඩසටහන් පිළිබඳ ප්‍රතිචාරීන්ගේ තෘප්ති මට්ටම්හි ද වෙනස්කම් දැකගත හැකි විය. ඒ අනුව පළමු කර්මාන්ත ශාලාවෙහි ප්‍රතිචාරීන්ගෙන් 56%ක් සුබසාධන වැඩසටහන් කෙරෙහි තෘප්තිමත් වන අතර 32%ක් ඒ කෙරෙහි අතෘප්තිමත් ප්‍රතිචාර දක්වා තිබේ. දෙවන කර්මාන්ත ශාලාවෙහි ප්‍රතිචාර දක්වන ලද සේවකයන්ගෙන් සුබසාධන වැඩසටහන් කෙරෙහි තෘප්ති මට්ටම 56%ක ද, අතෘප්ති මට්ටම 44%ක ද අගයක් ගෙන තිබේ. දෙවන කර්මාන්ත ශාලාවට සාපේක්ෂව පළමු කර්මාන්ත ශාලාවෙහි සුබසාධන වැඩසටහන්හි ඉහළ කාර්යක්ෂමතාවක් දැකගත හැකි විය.

මුඛ්‍ය පද : සේවක සුබසාධනය, සේවක තෘප්තිය, සේවක කාර්යසාධනය, නිෂ්පාදන කර්මාන්ත

*1 ආර්ථික විද්‍යාව, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* *thilinithushara88@gmail.com*

*2 ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;*